# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,176 — 1960 අගෝස්තු 5 වැනි සිකුරාද — 5.8.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 573 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 588 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 575 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම අධ්‍යුක්ත/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරියාගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම්කුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකායයීයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### සංගණකවරුන්ගේ (කොම්පියුටර්ස්) තනතුරු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංගණකවරු තනතුරු සඳහා පහත පෙනෙන ආකෘතිං පත්‍රය පිළියෙල කරන ලද අයදුම් පත් වර්ෂ 1960 අගෝස්තු මස 26 වැනි දින තෙක් හෝ ඊට කලින් භාරගනු ලැබේ. ආකෘති පත්‍ර සපයනු නොලැබේ :—

**2. වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් රුපියල් 888න් පටන් ගෙන 18 වර්ෂයක් අවුරුදු පතා රුපියල් 72න් වැඩිවී රුපියල් 2,184න් අවසන් වේ. (කාර්යක්ෂමතා කඩයිම රුපියල් 1,608 ප්‍රථමයි).

**3. සේවා කොන්දේසි**—

(1) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වේ. පත්වීම පළමුකොටම අවුරුදු 3ක ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වේ.

(2) තෝරා පත් කරන ලද අයදුම්කරුවන්ට සාමාන්‍යයෙන් කොළඹ සේවය කිරීමට සිදුවෙනවා ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) වර්ෂ 1960 අගෝස්තු මස 26 වෙනි දිනට වයස අවුරුදු 17ට අඩු හෝ 25ට වැඩි නොවිය යුතුයි.

(ආ) ඉතා උසස් චරිතයකින් යුක්ත විය යුතුයි.

(ඇ) ගණිතය විෂයයක් වශයෙන් ගෙන සම්මාන සාමර්ථයන් ලබා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමර්ථ වී සිටිය යුතුයි. ජලශක්ති විද්‍යා, කාලගුණ විද්‍යා විප්‍රහයන්හි හෝ සංඛ්‍යා ලේඛන වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් ලබා ඇති අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) පමණක් ඇමිණිය යුතුයි.

(අ) ලබා ඇති අධ්‍යාපන සහතික පත්‍ර.

(ආ) උප්පැන්න සහතිකය (සැ. යු. බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාර නොගනු ලැබේ). උප්පැන්න ලියා පදිංචි නො කරන ලද අයදුම්කරුවන්ට තමන්ගේ වයස ඔප්පුකිරීම පිණිස රිජිස්ත්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන විශේෂ සහතික ඉදිරිපත කළ හැක.

(ඇ) තම සුදුසුකම්, චරිතය හා මෙම පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ලබාගත් සහතික පත්‍ර තුනක් (රාජ්‍ය සේවයේ නියුක්තවූවනට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර වුවමනා නොකැරේ).

**සටහන.**—සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ආධුනිකයන් කොළඹදී මේ සම්බන්ධයෙන් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණීම අවශ්‍යවන අතර වුවමනාවක් වුවහොත් ලිඛිත විභාගයක් ද පවත්වනු ඇත. මේ සඳහා ගමන් වියදම් අයදුම්කරුවන් විසින්ම දැරීමට සිදුවනවා ඇත.

7. රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වෙනි ඡේදයේ මුල පළවී ඇති වැඩි විස්තරයන්ගෙන් දැනගත හැක.

ආර්. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500, කොළඹ 1,
වර්ෂ 1960 ජූලි මස 26 දින දීය.

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංගණක (කොම්පියුටර්ස්) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රයයි

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

4. ජාතිය :————.

5. විවාහකද අවිවාහකද යන වග :————.

6. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය.) : ————.

7. පාසැලින් අස්වූදා සිට කරන ලද රක්ෂාවන් ගැන විස්තරය : ————.

8. දැනට රක්ෂාවක් ඇතොත් ඒ ගැන විස්තර :————.

9. ජලශක්ති විද්‍යාත්මක හෝ කාලගුණ විද්‍යාත්මක හෝ සංඛ්‍යා ලේඛන වැඩ පිළිබඳ ලබා ඇති පළ පුරුදුකම් ගැන විස්තර : ————.

10. චරිත සහතික එවනු ලබන්නේ කාගෙන්ද යනවග :————.

මේ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති කරුණු සත්‍ය බවද, නිවැරදි බවද, සහතික කරමි. තවද මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි යයි තේරීමට කලින් අනාවරණය වුවහොත් මා එහින්ම නුසුදුසු බවට පත්වෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනොත් කිසිම වන්දියක් රහිතව මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වෙන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

ස්ථානය :————.

දිනය :————.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**විදින්නන්ගේ (Drillers) 2 වැනි ශ්‍රේණියට පත් කර ගැනීම සඳහා ආධුනික විදින්නන් බඳවා ගැනීම**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික විදින්නන්ගේ (Drillers) ශ්‍රේණියේ, තනතුරු පහක් සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **දීමනා.**—මසකට රුපියල් 50 බැගින් දීමනාවක් ද, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ජීවන දීමනාවක් ද මේ තනතුරුවලට පත්වන්නවුන්ට ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—ඉල්ලුම්කරුවන් ලාංකිකයන් විය යුතුය. තවද—

(අ) ඔවුන්ගේ වයස 1960 අගෝස්තු මස 20 වන දිනට අවුරුදු 18ට වැඩියෙන් හෝ අවුරුදු 30ට අඩු හෝ විය යුතුය.

(ආ) ඔවුන්—

(1) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමර්ථ්‍යය ලබා සිටිය යුතුය. නැතහොත් ;

(2) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමර්ථ්‍යය ලබා, මිකැනික් කෙනෙකු වශයෙන් යටත්පිරිසෙයින් අවුරුදු 3ක පළපුරුද්දක් ලැබූ අය විය යුතුය. නොඑසේ නම් මූලික කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණුවීමේ පාඨ මාර්ගයක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ අය විය යුතුය. ඒ හැර පෙට්රල්වලින් දුවවන යන්ත්‍රවල බැහැරදී රෙපයාර් කිරීමට හා විදුලි බලයෙන් දුවවන පොම්පවල රෙපයාර් කිරීමට පුළුවන් අය විය යුතුය :

(ඉ) ඔවුන්ට හොඳ ශාරීරික තත්ත්වයක් තිබිය යුතුය ;

(ඊ) ඉතා හොඳ චරිතයක් ඇතිවිය යුතුය.

4. **ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන පිළිවෙළ—**

(අ) පහත දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව ආකෘති පත්‍රයක් පුරවා, ලියාපදිංචි කළ තැපෑලෙන්, කොළඹ, තැපැල් පෙට්ටිය 500, වාරිමාර්ග අධ්‍යක්ෂගේ නමට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පැත්තේ උඩ කෙළවරේ "ආධුනික විදින්නන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර" යනු සඳහන් කොට එවිය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍ර පෞද්ගලිකව, දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට හෝ පහත අත්සන් කර ඇති මට හෝ නොඑවිය යුතුය. එසේම මෙම කායාලයේ කිසිම නිලධාරියෙකුගේ අතට පෞද්ගලිකව බාර නොදිය යුතුය.

(ඉ) ඉල්ලුම්පත්‍රයට සහතික පත්වල හෝ ලියවිලිවල හෝ මුල් පිටපත් අමුණා නොඑවිය යුතුය. එවිය යුත්තේ පිටපත් පමණකි. මේ පිටපත් හෝ මුල් පිටපත් අමුණා එවුවහොත් ඒවා හෝ ආපසු නොඑවන බව සැළකිය යුතුය.

(ඊ) ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් ලියවිලි ද ඉදිරිපත් කළ යුතුය :—

(1) උප්පැන්න සහතිකයේ පිටපතක් (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා වෙනුවෙන් නිකුත් කෙරෙන සහතික හෝ බාරගනු නොලැබේ).

(2) අධ්‍යාපනික සහතිකවල පිටපත්.

(3) චරිතය පිළිබඳ සහතික දෙකක පිටපත්. (ඒවායින් එකක් අවසාන වරට ඉගෙන ගත් පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙන් විය යුතුය).

(උ) යටකී අවශ්‍යතාවන්ට අනුකූලව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් නොකළහොත් හෝ මීට අවශ්‍ය අවම අධ්‍යාපනික සුදුසුකම් නොදරණ අය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍ර හෝ වයස් සීමාවෙන් පිටත අය විසින් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර හෝ බාර ගනු නොලැබේ. කෙසේවත් එවැනි ඉල්ලුම් පත්‍ර සලකා බලනු නොලැබේ. ප්‍රතික්ෂෙප කරන ලද ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් එසේ ප්‍රතික්ෂෙප කළ බව දන්වන ලියවිල්ලක් නොඑවන බව ද සැළකිය යුතුය.

(ඌ) 1960 අගෝස්තු මස 20 වැනි දින පස්වරු 1ට පෙර වාරිමාර්ග අධ්‍යක්ෂට ලැබෙන සේ ඉල්ලුම්පත්‍ර එවිය යුතුය.

5. **සේවා කොන්දේසි.**—මේ පත්වීම අවුරුද්දක සෝදිසි කාලයකට යටත් වේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන් "ඩයමන්කෝ" හා සෙසු විදීමේ ක්‍රම පිළිබඳ පුහුණුවීමේ පාඨ මාර්ගය අනුගමනය කළ යුතුය. බන්දා ගැනීමෙන් පසු පුහුණුව ලබන අය පාඨ මාර්ගය සාර්ථක ලෙස අනුගමනය කරන බවට හා දෙපාර්තමේන්තුවේ අවුරුදු 5ක් සේවය කරන බවටද රුපියල් 1,000ක ඇපකරයකට හා ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

**එම කොන්දේසි නිසි ලෙස නොපිළිපැද්දොත් පුහුණු කිරීම සඳහා යන වියදම් පුහුණුව ලබන තැනැත්තා විසින් ආපසු ආණ්ඩුවට ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයන් ඔවුන්ගේ වැඩ අසතුටුදායක බව පෙනී ගියහොත් හෝ ඒ වැඩ පිළිබඳ දක්ෂතාවයක් නැති බව පෙනී ගියහොත් හෝ කිසිත් දැන්වීමක් නොමැතිව අස් කරනු ලබන බව සැළකිය යුතුය. ඔවුන් දිවයිනේ කවර පෙදෙසක හෝ සේවය කිරීමට සූදානම් විය යුතුය. වැඩිපුරම කැලෑ පෙදෙස්වල් හෝ කුඩාරම්** ගසා වැඩ කිරීමට හෝ පොල් අතුවලින් සෑදූ තාවකාලික නිවාසවල හෝ සිටීමට සූදානම් විය යුතුය. අවුරුද්දක පුහුණුවීමේ කාලය අවසානයේදී ඔවුන් විසින් ප්‍රායෝගික පරීක්ෂණයකට හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඔවුන් මින් සමත් වුවහොත් ඇබෑර්තු තිබෙන අන්දමට වර්ෂයකට රුපියල් 750—42 වැඩිවීම් 13—1,296 දක්වා නගින වැටුප් ක්‍රමයක් ඇති දෙවැනි ශ්‍රේණියේ විදින්නන් වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුකම් ඇති යයි සලකනු ලැබේ. විදින්නන්ගේ තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඒ තනතුරු වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

6. **වෛද්‍ය පරීක්ෂණය.**—දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සෞඛ්‍ය සම්පන්න ද යනු පරීක්ෂා කිරීමට තෝරා ගනු ලබන අපේක්ෂකයන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

7. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දෙවැනි කොටසේ පළමුවන ඡේදයෙහි මූලාරම්භයෙහි දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිවලට මෙයින් අවධානය යොමු කරනු කැමැත්තෙමි.

නි. විජේවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවටය.

1960 ජූලි මස 26 දින,
කොළඹ, වාරිමාර්ග අධ්‍යක්ෂ කයාීලයේදී ය.

### ආකෘති පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආධුනික විදින්නන්ගේ තනතුරු සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලියුම් ලැබෙන පිළිවෙළ :————.

3. උපන් දින සහ උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය).

4. ජාතිය :————.

5. ඉල්ලුම්කරුවා විවාහකද, අවිවාහකද, නැතහොත් වැන්දඹුවෙක් ද යන බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් (සාමාර්ථ්‍යය ලැබූ විෂයන් සඳහන් කරන්න).

7. යම් යාන්ත්‍රික පළපුරුද්දක් ඇතහොත් ඒ බව :————.

8. දැනට යම් තනතුරකට පත්වී සිටී නම් ඒ බව :————.

9 අමුණා ඇති සහතික. පත්‍ර කාගෙන් ද යන බව :————.
(සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය).

මා විසින් මේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සැබෑ බව ද නිවැරදි බව ද මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම්හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණොත් මම තෝරා ගැනීමට නුසුදුස්සෙකු වශයෙන් සැළකීමට ද, පත් කර ගැනීමෙන් පසු දැන ගන්නට ලැබුණොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කිරීමට ද හැකි බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

ස්ථානය :————.
දිනය :————.

---

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1960 ඔක්තෝබර් 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් 30 දා දක්වා කුන්ඩසාලේ එළිමහන් සිර කඳවුරට දර සපයා ගෙනවුත් භාරදීම සඳහා එම ආයතනයේ අධිකාරී තුමන් විසින් 1960 සැප්තැම්බර් 15 දා පූ.භා 9.30 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

විස්තර මෙසේය :—

(1) දිගින් අඟල් 36 ට අඩුනොවූ, විෂ්කම්භය අඟල් 6 ට අඩු නොවූත් අඟල් 12 ට වැඩි නොවූත් තරමක වියලුනු රබර් දර.

(2) දිගින් අඟල් 18 ට අඩුනොවූ අඟල් 36 ට වැඩි නොවූත් විෂ්කම්භය අඟල් 3 ට අඩුනොවූත් අඟල් 12 ට වැඩි නොවූත් සම්පූර්ණයෙන් වියලුනු කැලෑ කඳ මෝරන ලද දර.

ලඟම පිහිටි කච්චේරියේ හෝ කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කායාීලයෙහි රු. 25ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරි

පත් කිරීමෙන් පහත අත්සන් කරන මාගෙන් 1960 සැප්තැම්බර් 14 දා පස්වරු 4 වන තුරු ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකියි. ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග අනු ආකෘති පත්‍රයක්ද විය යුතුයි.

ටෙන්ඩර් ආකෘති පත්‍ර සීල් කරන ලද කවරයක බහා වම් කෙළවරෙහි "දර සැපයීම සඳහායි" සඳහන් කර රෙජිස්ටර් තැපෑලෙන් හෝ නොඑසේ නම් ඒ සඳහා කායාීලයෙහි තබා තිබෙන පෙට්ටියෙහි දැමිය යුතුයි. යම්කිසි ටෙන්ඩර් කරුවෙකු විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර තැපෑලෙන් එවීමට අසතුටු නම් කායාීලයෙහි බලය ලත් ජේලර් මහතාට භාරදී කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

ආකෘති පත්‍රයෙහි සඳහන් මිල ගණන් අකුරෙන් හා ඉලක්කමෙන් විය යුතුයි. තෝරාගත් ටෙන්ඩර් කරුට දන්වා යවා සතියක් ඇතුලතදී අධිකාරි තුමා සමග ඒ පිළිබඳව කොන්දේසියකට නො බැඳුනොත් ඔහු විසින් තැන්පත් කළ රු. 25 රජය සතු කරනු ලැබේ.

ටෙන්ඩර් කරුට අවශ්‍ය නම් (1 ඡෙදයේ) සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ.

ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට සති 3 ට වලංගු ලෙස සලකනු ලැබේ.

ෂෙ. ව. අබේනායක,
බන්ධනාගාර උප අධිකාරී තුමා.

එලිමහන් සිර කඳවුර,
කුන්ඩසාලේ.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1960-61 මුදල් වර්‍ෂය තුළ කුන්ඩසාලේ එලිමහන් සිර කඳවුරෙහි උපදින පහත සඳහන් ද්‍රව්‍යයන් විකිණීම සඳහා එම ආයතනයෙහි අධිකාරි තුමන් විසින් 1960 සැප්තැම්බර් 15 දින පූර්වභාග 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(අ) දෙමසකට වරක් පොල් ගෙඩි 2,000 පමණ ;

(ආ) දිනපතා රබර් කිරි රාත්තල් (අමු) 30 පමණ ;

(ඇ) කොකෝ ගෙඩි 5,000ක් පමණ ;

(ඈ) සතිපතා කුකුළු බිත්තර 200 පමණ ;

(ඉ) සතිපතා කෙසෙල් කැන් 12 පමණ හා පැපොල් රාත්තල් 500 පමණ ;

(ඊ) සතියකට වරක් පැපොල් කිරි රාත්තලක් පමණ.

ඉහත සඳහන් කඳවුරේ උපදින ද්‍රව්‍යයන් සතියේ ඕනෑම දිනයක පූර්වභාග 9 සිට අපරභාග 3 දක්වා බැලිය හැක. ඒ ඒ වර්ගයේ ද්‍රව්‍ය යන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර සමග අනු ආකෘති පත්‍රයකින් ද සමන්විත විය යුතුයි.

ලගම පිහිටි කච්චේරියේ හෝ කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කායාීලයෙහි රු. 10ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරි පත් කිරීමෙන් පහත අත්සන් කරන මාගෙන් 1960 සැප්තැම්බර් 14 දා පස්වරු 4 වන තුරු ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකියි.

ටෙන්ඩර් ආකෘති පත්‍ර සීල් කරන ලද කවරයක බහා වම් කෙළවරෙහි ඉල්ලුම් කරන්නේ කුමන වර්ගය දැයි සඳහන් කර රෙජිස්ටර් තැපෑලෙන් හෝ නොඑසේ නම් ඒ සඳහා කායාීලයෙහි තබා ඇති පෙට්ටියේ දැමිය යුතුයි. කිසියම් ටෙන්ඩර් කරුවෙකු විසින් ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවීමට අසතුටු නම් කායාීලයෙහි බලය ලත් ජේලර් මහතාට බාර දී කුවිතාන්සියක් ලබාගත යුතුයි.

ටෙන්ඩර්කරු විසින් තම ආකෘති පත්‍රයෙහි සඳහන් කරන මිල ගණන් අකුරෙන් හා ඉලක්කමෙන් විය යුතුයි.

තෝරා ගත් ටෙන්ඩර් කරුට දන්වා යවා සතියක් තුළදී අධිකාරි තුමා සමග ඒ පිළිබඳ කොන්දේසියකට නොබැඳුනොත් ඔහු විසින් තැන්පත් කළ රු. 10 රජය සතු කරනු ලැබේ.

ටෙන්ඩර් කරුවනට අවශ්‍ය නම් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට සති තුනකට (3) වලංගු ලෙස සලකනු ලැබේ.

ෂෙ. ව. අබේනායක,
බන්ධනාගාර උප අධිකාරී තැන.

එලිමහන් සිර කඳවුර,
කුන්ඩසාලේ.

---

## 1960-61 වර්‍ෂයේ මහර බන්ධනාගාරයට දෙවෙනි කොහු ගුදිරි කොහු, ඉදල් මිටි, ඉරටු, අමුපොල්ලෙලි, දර සහ බට ලී සැපයීම

පහත අත්සන් කරන අය විසින් 1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ මහර බන්ධනාගාරයට (1) දෙවෙනි කොහු සහ ගුදිරි කොහු (2) ඉදල් මිටි, (3) ඉරටු, (4) අමු පොල් ලෙලි, (5) දර සහ (6) බටලී සැපයීම සඳහා 1960 අගෝස්තු මස 25 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(අ) දෙවෙනි කොහු සහ ගුදිරි කොහු සඳහා කැඳවන ටෙන්ඩර් පත්‍ර 1960-61 මුදල් වර්‍ෂයේ පළමුවන භාගයට පමණක් සීමා වනවා ඇත.

(ආ) දෙවෙනි කොහු සහ ගුදිරි කොහු සඳහා අය කරන මිල ගණන් වෙන වෙනම එකම ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුයි.

(ඇ) මුද්‍රා තබන ලද සැම්පල් වෙන වෙනම මහර බන්ධනාගාරයේ අධිකාරී තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර පමණක් ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

පහත අත්සන් කරන අය වෙත ඉල්ලුම් පතක් ඉදිරිපත් කිරීමෙන් ලබාගන්නා මුද්‍රිත පත්‍රවල ටෙන්ඩර් සඳහන් කළ යුතුයි. රුපියල් 10ක් මහර බන්ධනාගාර කායාීලයේ හෝ කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ඉල්ලුම් පතක් ලබාගත හැක. නියමිත මිල ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් සහ අංක වලින් දැක්විය යුතුයි.

මහර බන්ධනාගාරයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන හෝ රෙජිස්ටර් තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එහි දකුණු කෙළවර උඩ ............ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර යනුවෙන් සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ නියමිත වේලාව ඉකුත්වූ වහාම පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පැමිණිය හැක.

ඊ. ඇල්. ප්‍රනාන්දු,
අධිකාරී තැන, මහර බන්ධනාගාරය.

රාගම, 22.7.1960.

---

## 1960-61 වර්‍ෂය තුළ ගාල්ලේ බන්ධනාගාරයට කොහු මිටි, පිරපු කොහු සහ මිශ්‍ර කොහු සැපයීම

පහත අත්සන් කරන ලද අය විසින් ගාල්ලේ බන්ධනාගාරයට 1960-61 මුදල් වර්‍ෂය තුළ (අ) කොහු මිටි, (ආ) පිරපු කොහු, (ඇ) මිශ්‍ර කොහු සැපයීම සඳහා 1960 අගෝස්තු මස 26 වෙනි සිකුරාද පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 24 වෙනි බදාදා පස්වරු 3 දක්වා නිකුත් කරනු ලැබේ.

කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ එක් එක් ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදලින් රුපියල් 10ක් තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ලබා ගෙන පහත අත්සන් කළ අය වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර දෙකේම සැපයීම සඳහා මිල ගණන් ඉලක්කමින් මෙන්ම වචනයෙන්ද සඳහන් කර සීල් තබන ලද ලියුම් කවරයක බහා ලියා පදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුයි. තැපෑලෙන් නොයවනු ලබන ටෙන්ඩර් පත්‍ර අධිකාරිතැනට හෝ ඔහු විසින් පත් කරනු ලබන බලය ලත් නියෝජිතයෙකු වෙත් නම් ඔහුට හෝ බාරදිය යුතුය. ටෙන්ඩර් පත්‍රවල සියලුම වෙනස් කිරීම්, මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වනු ලැබීමෙන් දින 7ක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට ඇතුල්වීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැළකී සිටී නම් තැන්පත් කරන ලද මුදල රාජ සන්තක වෙනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ ගාල්ලේ බන්ධනාගාරයේ උප අධිකාරීතුමාගේ කාර්යාලයේදී 1960 අගෝස්තු මස 26 වෙනි සිකුරාද පෙරවරු 10.30 ටය. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ඉල්ලුම් කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

වැඩි විස්තර පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

එච්. ආර්. ප්‍රනාන්දු,
බන්ධනාගාර උප අධිකාරී.

1960 අගෝස්තු 5 වෙනි දින,
ගාල්ලේ බන්ධනාගාරයේදීය,

2. 1960 අගෝස්තු මස 23 වැනි දින දවල් 12 දක්වා පදවියේ ඉඩම් සංවර්ධන කාර්යාලයෙන් ලබාගතහැකි ටෙන්ඩර් පෝර්ම කොල සම්පූර්ණ කොට අනුපිටපතකුත් සමග ඉදිරිපත් කළ යුතුයි. ඉහත කී කාර්යාලයේ හෝ කච්චේරියක ඇප වශයෙන් රු. 50ක් තැන්පත් කළ යුතුයි. ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුයි. යම්හෙයකින් මෙම බඩුබාහිරාදිය කලින් කල සපයාදීමට නොහැකිවන ටෙන්ඩර්කරුවන්ගේ ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පදවියේ ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් සීල් තබනලද කවරයක වම්පස උඩ කෙළවරේ "මොරවැව ව්‍යාපාරයේ ගොඩනැගිලි ඉදිකිරීමට බඩුබාහිරාදිය සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන්කර, ලියාපදිංචි කළ තැපෑලෙන් මෙම කාර්යාලයට ලැබෙන්ට සැළැස්විය යුතුයි.

4. 1960 අගෝස්තු මස 26 වැනි දින සවස 3.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ කැමති ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

5. මේ ගැන වැඩි විස්තර අවශ්‍යනම් පදවිය ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් විමසන්න.

ඊ. ඩබ්ලිව්. ඇම්. පෙරේරා,
ඉඩම් සංවර්ධන නිලධාරි, පදවිය.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
පදවිය හන්දිය.

---

මගේ අංකය: ඒ/ඇල්. 369/60.

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ගාල්ලේ ආපන ශාලාව

ගාල්ලේ ආපන ශාලාව වරාය කොමසාරිස් තැන විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාල සීමාවකට බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1960 සැප්තැම්බර් මස 14 වෙනි බදාදා පස්වරු 2.30 දක්වා ම විසින් භාරගනු ලැබේ.

2. වරාය කොමසාරිස් තැනගේ කාර්‍යාලයෙන් ලබා ගතහැකි ටෙන්ඩර් පෝරමවල පිළියෙළ කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. කොළඹ වරාය කොමසාරිස් තැනගේ කාර්යාලයේ රු. 25ක් තැන්පත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම ලබා ගතහැක.

3. 1960 අගෝස්තු මස 30 වෙනි දින දවල් 12 දක්වා කාර්‍යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ඇත.

4. බද්ද පිළිබඳවූ කොන්දේසි ටෙන්ඩර් පෝරම සමග නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1960 ජූලි මස 22 වැනි දින.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

පහත සඳහන් වන දේ සැපයීම සඳහා ඒ එක් එක් දෙය කෙළින් දක්වා ඇති දිනවල පෙරවරු 10 වන තෙක් එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් භාරගනු ලැබේ :—

| | |
|---|---|
| 1. බස් මයි ටිකැට් පත්‍ර මුද්‍රණය කිරීමේ කරදාසි | 1960. 9. 28 |
| 2. ටිකැට් මුද්‍රණ යන්ත්‍ර | 1960. 9. 28 |
| 3. පී. වී. සී. ලෙදර් ක්ලෝත් | 1960. 10. 5 |
| 4. ලුබ්‍රිකේටිං තෙල් හා ග්‍රීස් | 1960. 10. 5 |
| 5. (පින්තාරු) තීන්ත | 1960. 10. 12 |

ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. ඒ පෝරම කොළඹ බොරලැස්ගමුවේ වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කාර්යාලයෙන්, ටෙන්ඩර පත්‍ර බාරගැනීම නවත්වන දිනයට කලින් ද දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ඒවා දෙනු ලබන්නේ කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් රු. 100 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඊට ලැබුණ කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960. 8. 5.

---

අංකය: ඇෆ්. සී. ජී/9/60 (බී)

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

**සේවාව සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම් :**

1960 ඔක්තෝබර් 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා, ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා විසින් බාරගනු ලැබේ.

**2. ටෙන්ඩර් තැන්පත් මුදල් :**

(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු ආයතනයන් සඳහා මෙම කාර්‍යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

**3. වත්කමේ විස්තර :**

මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම මේ කාර්යාලයෙන් ලබාගත යුතුයි.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

**4. සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර :**

දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

**5. ටෙන්ඩර් එවිය යුතු අන්දම :**

සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ", "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහ ලේකම් කාර්‍යාලය, ගාලු මුවදොර, කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහනලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

**6. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය :**

*මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.*

**7. ටෙන්ඩර් පත් විවෘත කිරීම :**

ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

**8. ටෙන්ඩරයන්හි සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාල සීමාව :**

ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**9. තැන්පත් ඇප මුදල් :**

තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලෙඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇපමුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

**10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි :**

ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තුවන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගතයුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

**11. අනික් විස්තර :**

(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටු රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරණ ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකි ය.

ඇස්. ඥාණසේගරම්,
සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙනුවට.

1960.8.1.
කොළඹ, ගාලුමුවදෙර මහලේකම් කාර්‍යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, මුදල් අංශයේදීය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන් පත් මුදල | (3) ඇප මුදල | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු සාමාන්‍ය කෑලි ගණන | (6) භාරගැනීම අවසන් වන දිනය හා වේලාව. |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| හැඳල ලාදුරු ආරෝග්‍යශාලාව ... ... | 100 | 200 | 5 | 16,700 | 1960. 8. 30 පෙරවරු 10 ට |
| රාගම ලය රෝහල ... ... ... | 100 | 200 | 3 | 8,900 | |
| උතුරු කොළඹ ආරෝග්‍යශාලාව— | | | | | |
| (1) වැනි අංශය.— වාට්ටු : 1, 3, 4, 5, 6, 7, 8 ඇල්.අයි.එච් 3, ඇල්. අයි. එච්. 4, සී. ඇන් 1, සී. එච්. 2, සාත්තු සේවිකාවන්ගේ නිවාසය, මුළුතැන් ගෙය, දිස් පැන්සරිය, බාහිර ලෙඩුන්ගේ අංශය, ඇක්ස්රේ කාමරය හස රසායනාගාරය ... ... | 100 | 200 | 3 | 7,900 | |
| (2) වැනි අංශය.— ළමා වාට්ටුව (වාට්ටු නො. 2) ... | 100 | 200 | 30 | 5,750 | |
| (3) වැනි අංශය.— සල්‍යාගාරය ඇල්. අයි. එච්., අයි. ඕ. අයි. එච්. 2 සහ ප්‍රසූති කාමරය ... ... | 100 | 200 | 10 | 8,950 | |
| වැළිසර v වැනි ජෝජ් රජතුමාගේ අනුස්මරණ ක්ෂය රෝහල— | | | | | |
| (1) වැනි අංශය.— පිරිමි වාට්ටු නො. 1 සිට 6 සහ 10 (සිර කරුවන්ගේ වාට්ටු) ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, රසායනාගාරය, පාලන අංශය, බාහිර රෝගීන්ගේ අංශය, ශල්‍යාගාරය, මුළුතැන් ගෙය, දිස්පැන්සරිය, මැහීමේ සහ තේ සෑදීමේ කාමරය ... | 100 | 200 | 3 | 7,950 | |
| (2) වැනි අංශය.— ගැහැණු වාට්ටු නො. 7 සිට 9 සහ 11 සිට 15 ... ... ... | 100 | 200 | 3 | 7,650 | |

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බඩුබාහිර ගෙනයාම

පුත්තලම් දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා අධිකාරි තුමා විසින් එම දිස්ත්‍රික්කයේ වෛද්‍ය ආයතනවලට දුම්රිය පොළවල සිට හා දුම්රිය බඩු බාරගන්නා ස්ථානවල සිට 1.10.60 සහ 30.9.62 කාලය අතරතුර බඩුබාහිර ආදිය ගෙන යෑම සඳහා මෙයට යාකර තිබෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10 ය දක්වා ලාංඡිකයින් ගෙන් හා වෙළඳ සමාගම්වලින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. මෙහි පහත දක්වෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10 යට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම වසා එකෙනෙහිම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට එතැනට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් කරුවන්ගේ නම්ද ඔවුන්ගේ ගාස්තු ප්‍රමාණයද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට, ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් සෞඛ්‍ය අධිකාරි තුමාගෙන් හෝ ඔහුගේ නියෝජිතයාගෙන් හෝ අවසර ලබාගෙන ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයක දෙවන පිටපත පරීක්ෂා කිරීමට හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර මේ කාර්‍යාලයෙන් හෝ කොළඹ, කලුතර, ගාල්ල, මාතර, බදුල්ල, මාතලේ, නුවර, කුරුණෑගල, කෑගල්ල, රත්නපුර, මඩකලපුව, අනුරාධපුර, වවුනියා සහ යාපනය යන ඕනෑම සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයකින් ලබාගත හැකි ෆෝර්මවල ලියා පිට පත් දෙකක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර අයදුම්කරුවන් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා පහත සඳහන් උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් මුදල කච්චේරියක තැන්පත් කර මුදල් කුවිතාන් සිය ටෙන්ඩර් පත්‍ර වසන දිනට පෙර දින මධ්‍යාහ්නයේ 12 ට පෙර ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් ඉල්ලන අය, කල්වේලා ඇතිව මුදල් කුවිතාන්සියක් සමග ඉල්ලුම් කළ යුතුය.

5. සියලුම ටෙන්ඩර් පත්‍ර පුත්තලමේ සෞඛ්‍ය සේවා අධිකාරි තුමාට ලැබෙන සේ එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ වම් පැත්තේ උඩ කෙළවරහි ටෙන්ඩර් පත්‍ර කුමන කරුණක් සඳහා ද යන්න ලිවිය යුතුයි. කවරයෙහි ටෙන්ඩරකරුවන් ගේ නම හා ලිපිනයද සඳහන් විය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර ඒ සඳහා මේ කායඹාලයෙහි පිළියෙල කර තිබෙන ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය. එසේ නැතහොත් මෙම කායඹාලයෙහි ගණකාධිකාරි තුමාට භාරදී රිසිට් පතක් ලබාගත හැක. රෙජිස්ටර් තැපෑලෙන්ද එවිය හැක. තැපෑලෙන් හෝ වෙන ක්‍රමය කින් හෝ ටෙන්ඩර් වසන දිනයේ පෙරවරු 10 ට පසු ඉදිරිපත් කරන ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

6. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් කරුවන් නොවන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලීමට ප්‍රථම ඔවුන්ගේ වත්කම පහත සඳහන් මට හෝ ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරනු ලබන නිළධාරි තැනට ඉදිරිපත් කල යුතුය. ඒ සඳහා නියමිත ආකෘති පත්‍ර මේ කායඹාලයෙන් හෝ මෙහි තුන්වන ඡේදයේ සඳහන් ඕනෑම කායඹාලයකින් ලබාගත හැක. දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් කරුවන් ඒ බව ටෙන්ඩර් පත්‍ර ඉල්ලනවිට දන්විය යුතුයි. එසේ නොවන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලනවිට තමන්ගේ වටිනාකම ප්‍රකාශ කලාද යන බවත් එසේනම් කාටද යන බවත් දන්විය යුතුයි.

**සටහන.**—ටෙන්ඩර් කරුවන්ට ඔවුන්ගේ වටිනාකම කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අවවාද කරනු ලැබේ. මෙසේ ඉදිරිපත් කල යුත්තේ ටෙන්ඩර් පත්‍ර සලකා බැලීමට පෙර ඔවුන්ගේ මුදල් තත්ත්වය ගැන රපෝර්තු ලබාගැනීමට අවශ්‍ය නිසාය.

7. ටෙන්ඩර් කරුවන් පහත සඳහන් කොන්දේසි විශේෂයෙන් මතක තබාගත යුතුයි :—

(අ) බඩුබාහිර ගෙනයාමේදී ප්‍රවාහන ගාස්තු ගෙවනු ලබන්නේ සැතපුම් 1/2 කට හෝ ඊට වැඩිනම් සැතපුමකටද සැතපුම් 1/2 කට අඩුනම් නියම දුරටත් ය.

(ආ) ටොන් එකකට වැඩි ප්‍රේෂනයට මුදල් ගෙවනු ලබන්නේ ඒ කොට්ඨාශයේ ආදායම් පාලක නිලධාරි තුමාගේ රෙකම දාරුව අනුවය.

(ඇ) පසුව විවෘත කරනු ලබන ආයතනවලට බඩු ගෙන යාමේදී ප්‍රවාහන ගාස්තු ගෙවනු ලබන්නේ ආදායම් පාලක නිලධාරි තුමාගේ ගාස්තු අනුවය.

8. ටෙන්ඩර් කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පසු පිටෙහි සඳහන්ව ඇත. එහි සඳහන් කොන්දේසි ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන විට ටෙන්ඩර්කරුවන්ගේ අවධානයට යොමු විය යුතුයි. කිසිම කරුණක් නොදක්වා ටෙන්ඩර්, පත්‍ර එකක් හෝ සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතුය.

සිරිල් ඒ. වේරපමාල්,
සෞඛ්‍ය සේවා අධිකාරි තැන,
**පුත්තලම.**

සෞඛ්‍ය සේවා අධිකාරිතැනගේ කායඹාලය,
පුත්තලම, 23. 7. 1960.

## පූර්වෝක්ත උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | (3) ආරක්ෂක තැන්පත් මුදල රු. ශ. | (4) ටෙන්ඩර් වැසීමේ දිනය හා වේලාව |
|---|---|---|---|
| බඩුබාහිරාදිය දුම්රිය පොළවලින් හා දුම්රියට බඩු ගන්නා ස්ථානවලින් වෛද්‍ය ආයතනවලට ගෙනයෑම, එම ආයතන වලින් දුම්රියපොළට හෝ දුම්රියට බඩුබාර ගන්නා ස්ථානවලට ගෙන ඒම— | | | |
| (1) පුත්තලම, පාලවි සහ මුන්දලම ... | 100 0 ... | 300 0 .... | 23.8.60 පූ. භා. 10 |
| (2) බෝලවත්ත, ලුනුවිල, නාත්තන්ඩිය, කුඩාවැව, මාදම්පෙ, හලාවත, බංගදෙනිය සහ බත්තුළුඔය ... | 100 0 ... | 400 0 ... | 23.8.60 පූ. භා. 10 |
| (3) ගල්ගමුව ... ... | 100 0 ... | 200 0 ... | 23.8.60 පූ. භා. 10 |

### සෞඛ්‍ය දෙපාතීමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය දෙපාතීමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් ජල කර්මාන්තයන් තැනීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 අගෝස්තු 30 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) ජල සම්පාදන ක්‍රමයක් තැනීම, දිඹුල ආරෝග්‍යශාලාව, කොටගල

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 අගෝස්තු 19 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ, රුපියල් 20,000 ට වඩා වටිනාකමැති ජල සම්පාදන කරමාන්තයන් සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබා ගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය දෙපාතීමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කායඹාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත්, ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිළධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරිංටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
1. 8. 60.

---

### සෞඛ්‍ය දෙපාතීමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පහත සඳහන් වැඩ කරවීම සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 අගෝස්තු 23 වැනි අඟහරුවාදා උදය 10 වනතෙක් බාරගනු ලැබේ :—

(1) මතුපිට කාණු තැනීමේ යෝජනා ක්‍රමය—රත්නපුර පළාත් ආණ්ඩු සභාව.

(2) මතුපිට කාණු තැනීමේ යෝජනා ක්‍රමය—1 පියවර—වත්තල-මාබෝලේ-පෑලියගොඩ පළාත් ආණ්ඩු සභාව.

2. ටෙන්ඩර් පත්‍රිකා 1960 අගෝස්තු 19 වැනි කිවිදා සවස 4 වන තෙක් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් නිකුත් කරනු ලබන්නේ, මින් පෙර රුපියල් 50,000 වඩා වටිනාකම ඇති, කානු තැනීම හෝ ඒ හා සමාන අන් වැඩ සඳහා පළපුරුදු රජයේ හෝ නාගරික සභාවන් හි ලියාපදිංචි වී සිටින බව ලියවිලි වලින් ඔප්පුකළ හැකි කොන්ත්‍රාත් කරුවනට පමණක් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ සෑම ටෙන්ඩරයක් සඳහාම රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙරාතුව ඉල්ලුම් කරුවන් විසින් සැලසුම්, විස්තර විභාග සහ ගිවිසුම් යනාදී කරුණු ගැන අවශ්‍ය විස්තර ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නා ලෙසද වැඩය අරඹන භූමිය පරීක්ෂාකරන ලෙසද නිවේදනය කරනු ලැබේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට ප්‍රථම තෝරාගත් අයදුම්කරු විසින් 5% වැඩි නොවන ඇප මුදලක් නියමිත කොන්ත්‍රාත්තුව

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ත්‍රිපොලි වෙළඳ සැලෙහි පිහිටි ආරෝග්‍යශාලාවලට ආහාර සැපයීමේ අංශයේ මූලස්ථානයට සහ අනිකුත් ආයතනයන්ට 1960.10.1 සිට 1961.3.31 දක්වා අළුත් බටර් සැපයීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම්පත් කොළඹ යුනියන් ප්ලේස්හි පිහිටි වාණිජ වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ටෙන්ඩර් බෝඩ් කොමිටියේ සභාපති තුමා විසින් 1960 අගෝස්තු මස 29 වැනි සඳුදා අ. භා. 2.30 වෙනතුරු භාරගනු ලැබේ. කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් ලබාගන්නාලද පෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සමඟ එවිය යුතුය. කොළඹ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 50 ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960.8.29 දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් තුමා වෙනුවට.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
62, චැතැම් වීදිය,
කොළඹ 1, 1960.7.28 දිය.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ බොරැල්ලේ සර්පන්ටයින් පාරේ පිහිටි මුළුතැන්ගෙට සහ මරදානේ තිබෙන ත්‍රිපොලි වෙළඳ සැලට 1960.10.1 සිට 1960.12.31 දක්වා ලෙලි රහිත පොල් සැපයීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ යුනියන් ප්ලේස්හි පිහිටි වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ටෙන්ඩර් බෝඩ් කොමිටියේ සභාපතිතුමා විසින් 1960 අගෝස්තු 29 වෙනි සඳුදා අ. භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් ලබාගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සමඟ එවිය යුතුය. රු. 200ක් කොළඹ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960.8.29 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් දැනගැනීමට පුළුවන.

ඇම්. ඇස්. විජේරත්න,
